www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# රුසියානු විප්ලවයේ පටන් අනූ වසරක්: විසිවෙනි සියවසේ සමාජවාදය සඳහා අවස්ථාවන්

*3වන කොටස*

**Ninety years since the Russian Revolution: The prospects for socialism in the twenty-first century**

**නික් බීම්ස් විසිනි**
**2007 නොවැම්බර් 27**

1917 පෙබරවාරියේදී රුසියාව තුල ඇතිවූ විප්ලවය ප්‍රථමයෙන් ඇවිල ගියේ පාන් හිඟය මුල්කරගෙන කාන්තාවන් විසින් ගෙන ගිය විරෝධතාවකිනි. ඔවුන්ගේ අරගලය කරා කම්කරු පන්තියේ අනෙකුත් කොටස් ද වේගයෙන් ඇදී ආවේය. 1905 සිදුවීම්වල කලබැගෑනිය මධ්‍යයේ අගනුවර ආරක්ෂාව පිලිබඳව සාර් පාලනතන්ත්‍රය විශ්වාසය තබා සිටි හමුදා සේනාංක මෙවර ද කැඳවන ලදී. එහෙත් පෙලපාලිවලට වෙඩිතැබීම ප්‍රතික්ෂේප කරමින්, ඔවුන් ඒවාට එක්වූ විට සාර්වාදී ඒකාධිපතිත්වයේ ඉරනමට මුද්‍රා තැබුනි.

පෙබරවාරි විප්ලවය, නව යුගයක පිලිසිඳ ගැනීම සලකුනු කලේය. එහෙත් මෙහි දී සිදු වූයේ නිවුන් දරු ප්‍රසූතියකි. එකක් නොව බල මධ්‍යස්ථාන දෙකක් බිහිවිය. ධනපති හා ගොවි පක්ෂවලින් සැදුම් ලත් තාවකාලික ආන්ඩුව හා සෝවියට් සභා නැතහොත් කම්කරු කමිටු ය. 1905 විප්ලවයේදී ගොඩනගන ලද සෝවියට් සභා පෙබරවාරි දිනවල දී ඉක්මනින් ම යලි පිහිටුවන ලදී. බොල්ෂෙවිකයන් ද ඇතුලත් සියලු සමාජවාදී පක්ෂවල ආරම්භක ප්‍රතිචාරය වූයේ තාවකාලික ආන්ඩුවට කොන්දේසි සහිතව සහයෝගය දැක්වීමයි.

කෙසේ හෝ, අප්‍රේල් මුලදී රුසියාවට යලිත් පැමිනි ලෙනින් දේශපාලන බෝම්බයක් අතහැරියේය. බොල්ෂෙවික් පක්ෂය හැරිය යුත්තේ, කම්කරු පන්තිය දේශපාලන බලය අල්ලාගැනීම කරා මෙහෙයවීමට බව ඔහු අවධාරනය කලේය. එහෙත් ලෙනින්ගේ ඉදිරි දර්ශනය කෙරෙහි පක්ෂ නායකත්වය තුල බලගතු විරුද්ධත්වයක් පැවතුනි.

මෙම වෙනස ඇති කලේ කුමක් විසින් ද? පෙබරවාරි විප්ලවය පෙන්නුම් කලේ ගොවි ජනතාවට ස්වාධීන ක්‍රියා කලාපයක් ඉටු කල නොහැකි බවයි. ධනේශ්වර පක්ෂ ගොවි ජනතාවගේ සහායෙන් පාලනය ගෙන ගිය අතර තවකාලික ආන්ඩුවේ රූපයෙන් "කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වය" සාක්ෂාත් විය.

ආරම්භයේදී ආන්ඩුව ජනතාව අතර මෙන් ම තව මත් බොල්ෂෙවිකයන් සුලුතරයක් වූ සෝවියට් සභාවල ද සහයෝගය දිනාගත්තේය.

එහෙත් තාවකාලික ආන්ඩුවට ජනතාවගේ ඉල්ලීම් ඉටුකිරීමට නොහැකි විය. රුසියානු ධනේශ්වරය දහස් ගනන් හුයපටවලින් බටහිර අධිරාජ්‍යවාදයට ගැටගැසී තිබුන බැවින් ආන්ඩුවට යුද්ධය නතර කල නොහැකි විය. තව ද දිග්විජය පිලිබඳ තමන්ගේ ම න්‍යාය පත්‍රයක් ද ඔවුන් සතු විය. ඉඩම් හිමියන්ට එරෙහි ගොවීන්ගේ කැරැල්ලට සහයෝගය දීමට එයට නොහැකි වූයේ, ධනේශ්වරය ම එම පන්තියට බැඳී සිටි නිසා ය. ඉඩම්වලට බැඳී තිබුනු දේපල පෙරලා දැමුව හොත් සියලු වර්ගවල දේපල පිලිබඳ ප්‍රශ්නය මතු වේ යයි ඔවුන් බියට පත්විය. සාර්වාදී රුසියාව අංග ලක්ෂිතව තිබූ ජාතික පීඩනය අවසන් කිරීමට ද ඔවුන්ට හැකි වූයේ නැත.

කෙටියෙන් කිවහොත්, තාවකාලික ආන්ඩුව බලයට පත්කොට තිබුනේ, ඔවුන් මුහුනදීමට ලැස්තිව නොසිටි ව්‍යාපාරයක්, ඔවුන්ට අවශ්‍ය නොවූ ව්‍යාපාරයක්, හා ඔවුන්ට ඉටුකල නොහැකි ඉල්ලීම් කැටිකොටගත් ව්‍යාපාරයක් විසින් ය.

පෙබරවාරි සිට ඔක්තෝබර් දක්වා මාස සලකුනු වූයේ වමට ගමන් කල ව්‍යාපාරයක් මගින්ය. මෙය, අගෝස්තු හා සැප්තැම්බරයේ ජෙනරාල් කෝර්නිලෝව් විසින් සූදානම් කල කුමන්ත්‍රනයෙන් පසුව වේගවත් විය. මෙයින් හෙලිදරව් වූයේ, ප්‍රතිවිප්ලවය පිලිබඳව තාවකාලික ආන්ඩුවේ නූසූදානමයි. කම්කරු පන්තියේ ඇස් ඉදිරියේ ධනේශ්වර තාවකාලික ආන්ඩුවට සහාය දෙන පක්ෂ එන්ට එන්ටම අපකීර්තියට පත්වීම හමුවේ සෝවියට් සභා තුල බොල්ෂෙවිකයන්ට ලැබුනු සහයෝගය අඛන්ඩව වර්ධනය විය.

එහෙත් ඔක්තෝබර් විප්ලවය අභිප්‍රේරනය කල එක ම සාධකය රුසියානු තත්වය ම නොවීය. බලය අල්ලාගැනීම පිලිබඳ සිය ඉල්ලීම් දැඩි කිරීමේ දී සියල්ලටමත් වඩා ලෙනින්ට මග පෙන්වූයේ ජාත්‍යන්තර

තත්වයයි. රුසියානු විප්ලවය රුසියානු ප්‍රශ්නයක් නොවූ අතර එය ලෝක විප්ලවයේ ආරම්භක වෙඩි මුරය විය. ජාත්‍යන්තර කම්කරු පන්තියට යුද්ධයේ ම්ලේච්චත්වයෙන් මෙන් ම, තමන්ගේ ම නායකත්වයේ පාවාදීම් මගින් ඔවුන් ඈදදමා තිබූ හිරවීමේ තත්වයෙන් ගොඩයාමේ මාවතක් පෙන්වීම සඳහා ද රුසියාව තුල බලය ගැනීම අවශ්‍ය විය.

නැගිටීම, බලය සෝවියට් සභා අතට පත් කලේය. ආරම්භයේ පටන් ම, ධනේශ්වර පක්ෂ හා ඔවුන්ගේ ප්‍රධාන සහකරුවන් ද මෙන්ෂෙවිකයන් ද ඊනියා මධ්‍යස්ථ සමාජවාදීන් ද ගොවි පදනමක් සහිත සමාජ විප්ලවවාදී පක්ෂය ද විසින් එයට විරෝධය පලකලහ. ඔවුන්ට අනුව, බොල්ෂෙවිකයන් අරාජකවාදීන්ය, කුමන්ත්‍රනකරුවන්ය, බලය අල්ලාගැනීම නීති විරෝධීය.

තාවකාලික ආන්ඩුව පෙරලා දැමීමෙන් පසුව, මෙම සියලු බලවේගයන්ගේ අවධානය යොමු වූයේ 1918 ජනවාරියේ දී කැඳවූ ව්‍යවස්ථා සම්පාදක මන්ඩලය වෙත ය. මෙම මන්ඩලය කැඳවීම, දිගු කාලයක් තිස්සේ සමාජවාදීන්ගේ හා ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ ඉල්ලීමක්ව තිබුනි. එහෙත් සිදුවීම් එය ඉක්මවා ගියේය. ව්‍යවස්ථා සම්පාදක මන්ඩලය විසින් පිහිටුවන ආන්ඩුව විසින් දේශපාලන බලය සෝවියට් සභා අතට පත් කල යුතු යයි ද, විප්ලවයේ නීත්‍යනුකුලභාවය පිලිගත යුතු යයි ද කිසිදු පක්ෂයක් ඉල්ලා නොසිටියහ.

එබැවින් ව්‍යවස්ථා සම්පාදක මන්ඩලයට කටයුතු කල හැක්කේ ප්‍රති විප්ලවය සංවිධානය කිරීමට අවධානය යොමුකිරීම ලෙස පමනි. එය විසිරුවා හැරි අතර දර්ශන පථයෙන් අතුරුදන් විය. එක් ප්‍රමුඛ සමාජ විප්ලවවාදියෙක් නිරීක්ෂනය කල අයුරු එය අභාවප්‍රාප්ත වූයේ "අපගේ විසුරුවාලීම කෙරෙහි ජනතාව දැක් වූ උදාසීනත්වයේ ප්‍රති විපාකයක් ලෙසය."

මෙහි දී අපට, වඩාත් ම අවශ්‍ය කරුනු ඉදිරිපත් කරනවා හැරෙන්නට. ප්‍රථම කම්කරු රාජ්‍යය පරිහානියට පත්වීමේ ඉතිහාසය හා ස්ටැලින්වාදී නිලධරයේ නැගීම පිලිබඳ විචාරයක් කල නොහැකිය.

පරිහානිය, මාක්ස්වාදයේ හෝ බොල්ෂෙවික්වාදයේ හා ඊට අඩු ලංසුවෙන් ව්‍යවස්ථා සම්පාදක මන්ඩලය විසුරුවා හැරීමේ කිසියම් නියාමයක ප්‍රතිපලය නොවීය. පරිහානිය විප්ලවය හුදෙකලා වීමේ නිමැවුමක් විය. ලෙනින්ගේ හා ට්‍රොට්ස්කිගේ ඉදිරිදර්ශනය වූයේ විප්ලවය, බටහිර යුරෝපයට පැතිර ගියේ නැත්නම්, සෝවියට් ආන්ඩුවට තවදුරටත් බලය දරාගෙන සිටීමේ හැකියාවක් නොමැති බවටයි. සිද්ධි දාමයේ දී, කම්කරු පන්තියේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී නායකත්වයේ පාවාදීමට පින්සිදු වන්නට විප්ලවය ඉන් එහාට ගියේ නැත. එහි අර්ථය විප්ලවය පෙරලා දැමූ බව නො වේ.

කෙසේ නමුදු හුදෙකලාව, බිහිසුනු බලපෑමක් ඇති කලේය. කම්කරු රාජ්‍යය පරිහානි ගත වීමේ ද, ස්ටැලින්ගේ නායකත්වයෙන් යුත් පිලිකාවක් බඳු නිලධරය විසින් දේශපාලන බලය පැහැර ගැනීමේ ද ප්‍රධාන සාධකය වූයේ එය යි. අපට වඩාත් ම අවශ්‍ය කරුනු ප්‍රථම කම්කරු රාජ්‍ය පරිහානියට පත්වීමේ ඉතිහාසය මෙන් ම ස්ටැලින්වාදී නිලධරයේ නැගීම පිලිබඳ විචාරයක් කල නොහැකි අතර මෙම අධිකාරය, විප්ලවයට නායකත්වය දුන් සියලු බොල්ෂෙවිකයන් මරා දැමීය. එය කුලුගැන්වුනේ 1940 දී ලියොන් ට්‍රොට්ස්කි ඝාතනය කිරීමෙනි. 1991 දී ධනපතියන් වෙත පවරා දී ධනවාදය පුනරුත්ථාපනය කරන තෙක් ම ස්ටැලින්වාදීහු, ධනේශ්වර පර්යාය නගාසිටුවීමේ මූලික ක්‍රියා කලාපයක් ඉටු කලහ.

## සමාජවාදය සඳහා අවස්ථාවන්

විසි එක්වෙනි සියවසේ සමාජවාදය සඳහා ඇත්තේ කුමන අවස්ථාවන් ද? රුසියානු විප්ලවය, අදට ඔබින පාඩම් ගැබ්කර නොගත්තා නමුත්, සිත් ඇදගන්නා සුලු අත්දැකීමක් ලෙස, හුදෙක් ඉතිහාසයට එක්වන්නේ ද? මෙයට පිලිතුරු දීම සඳහා අප ඓතිහාසික ක්‍රියාවලිය එලෙසින් ම විචාරයට ලක් කල යුතුය.

ආපසු හැරී බලන විට අපට දැන් පෙනීයන්නේ ප්‍රථම ලෝක සංග්‍රාමය හා රුසියානු විප්ලවය, ධනේශ්වර භූගෝලීයකරනයේ ප්‍රථම අදියරෙහි ප්‍රතිඵලය වූ බවය. 1871 සිට 1914 දක්වා වූ කාලය තුල ලෝකය පරිවර්තනය කල ඉමහත් ආර්ථික වර්ධනය, ධනේශ්වර නිෂ්පාදන ක්‍රමයේ සියලු ප්‍රතිසතිතාවන් ඉස්මත්තට ගෙන ආවේය.

වසර අනූවකට පෙර බොල්ෂෙවිකයන්ට මඟපෙන්වූ ඉදිරි දර්ශනය වූයේ ලෝක සමාජවාදී ඉදිරිදර්ශනය යි. එහෙත් එම විප්ලවය ප්‍රථමයෙන් ගත් උත්සාහය අසාර්ථක වූ අතර මනුෂ්‍ය වර්ගයාට බිහිසුනු මිලක් ගෙවීමට සිදුවිය. ඊලඟ දශක තුන තුල අත්දුටුවේ අවපාතය, මහා විරැකියාව, ෆැසිස්ට්වාදය, පරමානුක ආයුධ යෙදාගැනීමෙන් යුද්ධයේ දී දශලක්ෂ ගනන් මරාදැමීම හා හොලොකෝස්ටයේ කිව නොහැකි තරමේ භීෂනයයි.

ඉන් පසුව පැමිනියේ සාපේක්ෂ ස්ථාවරත්වයේ කාල පරිච්ඡේදයකි. විසිවෙනි සියවසේ මුල් භාගයේ ගැටලු අතීතයට අයත් වූ බවක් පෙනීගිය නව ආර්ථික ප්‍රසාරනය ධනවාදී ඉසුරුමත් බවේ ඉහල නැඟීමක් පවා සලකුනු කලේ ය. එහෙත් 1960 ගනන් අවසානයේ දී පශ්චාත් යුද්ධ උත්පාතය අවසන්වූයේ ලෝකය පුරා කම්කරු පන්තියේ විප්ලවවාදී ශක්‍යතාවක් සහිත අරගලයන් මාලාවක පැනනැගීමට සම්පාත වෙමින්ය. ඒ අතර, 1968 ප්‍රන්සයේ මැයි ජූනි ජෙනරල් සට්‍රයිකය, ඉතාලියේ උනුසුම් ශරත් සමය, 1973-74 බ්‍රිතාන්‍යයේ

හීත්ගේ ටෝරි ආන්ඩුව පලවා හැරීම මෙන්ම 1975 වසරේ දී පෘතුගාලයේ සලසාර් පාලන තන්ත්‍රයේ බිඳ වැටීම ද වෙයි. එහෙත් මෙම කිසිදු අරගලයක දී කම්කරු පන්තියට, සිය නායකත්වයේ පාවා දීමේ හේතුව නිසා දේශපාලන බලයට අභියෝග කල නොහැකි විය.

මෙම පාවාදීම් සිය තත්වය ස්ථාවර කරගැනීමට උපයෝගී කරගත් ධනේශ්වරය, කම්කරු පන්තියට එරෙහි ප්‍රහාරයන් මාලාවක් ම එල්ල කලේය. 1970 ගනන් අවසන් භාගයේ ආරම්භ වූ මෙය අද දක්වාමත් ක්‍රියාත්මකව පවතියි. පසුගිය තිස් වසර පුරා කම්කරු පන්තිය පරාජයන් හා පසුබැසීම් මාලාවකට ම මුහුන පෑවේය. සමාජවාදය පිලිබඳ බලාපොරොත්තු මුලුමනින් ම සාක්ෂාත් කල නොහැකි තරම් ඈතකට නැතිනම්, පසුබිමට තල්ලුවී ගිය බවක් පෙනී ගියේය.

තිස් වසරක් යනු පුද්ගලයෙකුගේ ජීවිතයෙන් සැලකිය යුතු කාලයකි. පැරනි පරම්පරාවේ සාමාජිකයන්ට සිය තරුන විය අපතේ ගොස් ඇති බවක් හැඟීයන අතර, වෙනසක් සඳහා වන සිය කැමැත්ත පදනම් කල හැකි තැනක්, අඩු ම තරමින් මෑත අතීතයේ පැවති බවක් තරුන ජනතාවට නොපැවති බවක් පෙනී යා හැකිය.

තිස් වසරක් යනු දිගු කලක් ලෙස පෙනී යා හැකිය. එහෙත්, ආර්ථික ක්‍රියාවලියේ හා සමාජ, සංස්කෘතික සම්බන්ධතාවන්හි පරිවර්තනයන් සැලකිල්ලට ගනිමින්, ඉතිහාසයේ මිම්මෙන් බර තැබූ කල්හි, එය කෙටි විරාමයක් වනු ඇත.

කුමන වෙනස්කම් සිදුවී තිබේ ද? ධනේශ්වර ලෝක ව්‍යූහයේ ම පරිවර්තනයක් සිදුව ඇති බවක් අතීතය නම් දැකගනු ඇත. අප ජීවත්ව ඇත්තේ ධනේශ්වර භුගෝලීයකරනයේ දෙවන අදියර තුලය. සෑම කොටසක් ම නො වෙන්කල හැකි සේ එකිනෙකට සම්බන්ධව ඇති හා කොටස් නොකල හැකි ආර්ථික ඒකකයක් බවට මුලු ලෝකය ම පත්ව තිබේ.

සමාජවාදය සඳහා වන අවස්ථාවන් පිලිබඳ ඇඟවුම් කවරේද? මාක්ස්වාදී දේශපාලනයේ අ යනු ආ යනු දෙසට අප මඳක් හැරී බලමු.

අපගේ ඉදිරි දර්ශනය පදනම් වී ඇත්තේ සමාජවාදය සඳහා වෛෂයික පූර්වාවශ්‍යතාවන් සොයාගත යුත්තේ ධනේශ්වර පද්ධතියේ ප්‍රතිසතිතාවන් තුලින්ම ය යන සංකල්පය මතය. නිශ්චිත අවස්ථාවකදී මෙම ප්‍රතිසතිතාවන් ධනේශ්වර පර්යායේ බිඳ වැටීමකට හා ධනේශ්වර පාලනයේ ඓතිහාසික අර්බුදයකට තුඩුදෙයි.

අද අප සිටින්නේ කොතැනකද? පිලිතුර පැහැදිලිය. භුගෝලීයකරන ආර්ථික සන්තතිය, ලෝක ආර්ථිකය හා ජාතික රාජ්‍ය පද්ධතිය අතර ප්‍රතිවිරෝධයේ තීව්‍රතාවය නව ඉහලකට ඔසවා ඇත. වෙනත් වචනවලින් කිවහොත්, සමාජයේ ද්‍රව්‍යමය නිෂ්පාදන බලවේග නිෂ්පාදනයේ පවත්නා සම්බන්ධතාවන් සමග ගැටුමකට එලඹෙන්නේය යන මාක්ස්ගේ ඡේදය උපුටා දැක්විය හැකිය. ප්‍රථම ලෝක සංග්‍රාමයට තුඩුදුන් කාලපරිච්ඡේදයේ දී මෙන් ම එම ගැටුම ප්‍රකාශිත වන්නේ අන්තර් අධිරාජ්‍යවාදී එදිරිවාදිකම් තුලින් ය. ඇමරිකානු ජනාධිපති තුන්වෙනි ලෝක යුද්ධය ගැන කථාකරනු අපට හදිසියේ ම අසන්නට ලැබෙන්නේ එබැවින්ය.

තව ද, පසුගිය තිස්වසර තුල ඇතිවූ දැවැන්ත ආර්ථික වෙනස්කම්වලින් එක්සත් ජනපදය සතුව පැවති සාපේක්ෂ ආර්ථික ශක්තියට මුලුමනින්ම වල කපා ඇත. එය, දෙවන ලෝක යුද්ධයෙන් පසු කාල පරිච්ඡේදයේ ලෝක ධනවාදය ස්ථාවර කරනු ලැබූ සාධකය විය. ස්ථාවරත්වයේ බලවේගය වනවා වෙනුවට අද එක්සත් ජනපදය, ලෝක ආර්ථික හා දේශපාලනයේ අස්ථාවරත්වයට තුඩුදෙන ලොකු ම සාධකය බවට පත්ව තිබේ. මිලිටරිවාදය කරා එන්ට එන්ටම වැඩිවන එහි නැඹුරුව, ධනේශ්වර බලවතුන් අතර සම්බන්ධතාවන් කඩාකප්පල් කරන අතර එහි ගැඹුරු වන මූල්‍ය අර්බුදය ව්‍යසනකාරී පරිමාවකින් ගෝලීය ආර්ථිකය බිඳදැමීමේ තර්ජනය මතු කරයි. *අධිරාජ්‍යවාදය* නමැති සිය කෘතිය තුල ලෙනින්, ප්‍රථම ලෝක සංග්‍රාමය අවධියේ දී පරපුටුවාදයේ වැඩීම පිලිබඳව සඳහන් කරයි. එහෙත් ලෙනින් පෙන්වා දුන් ක්‍රියාවලීන්ගේ වැදගත්කම අද තත්වයත් සමඟ සසඳන කල සුලුකොට තැකීමට සිදුවේ.

ධනවාදය පෙරලා දැමීමේ හැකියාව සහිත එක ම සමාජ බලවේගය වන කම්කරු පන්තියේ තත්වය කෙබඳු ද? භුගෝලීය සන්තතීන්ගේ ප්‍රතිඵලය වී ඇත්තේ මෙම සමාජ පන්තිය ප්‍රමානයෙන් මෙන් ම භුගෝලීය පැතිරීම අතින්ද ඉමහත් ලෙස වැඩි වර්ධනය වී තිබේ.

පසුගිය දශක දෙකක පමන කාලය තුල, සමහර අවස්ථාවල ඊටත් අඩු කාලයක් තුල, චීනයේ, ඉන්දියාවේ, ලතින් ඇමරිකාවේ, අප්‍රිකාවේ - ලෝකය පුරාම - මිලියන ගනනක් ගොවීන් හා සුලු නිෂ්පාදකයන් ගෝලීය නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ වැටුප් කම්කරුවන් බවට පත්ව තිබේ. පනස් වසරකට පෙර බොහෝ උගත් සමහරවිට එතරම් උගත් නැති විද්‍යාර්ථීන් ලෝක ජනගහනයෙන් බහුතරය නිර්ධනීකරනය වීම පිලිබඳ මාක්ස්ගේ අනාවැකි ඉටු වී නැති බව ප්‍රකාශ කලහ. මක්නිසාද යත් ගොවි ජනතාවගේ වැදගත්කම නිසා ය. ඉතිහාසය දැන් මාක්ස් කරා පැමින තිබේ.

භුගෝලීයකරනයේ තවත් ඉතා තීරනාත්මක බලපෑමක් තිබේ. ඔක්තෝබර් විප්ලවයට පසුව

බොල්ෂෙවිකයන් මුහුනදුන් සංකීර්න ගැටලු කෙරේ අවධානය යොමුකරන අධ්‍යයනයක්, රාජ්‍යය හා සිවිල් සේවය තුල මධ්‍යම පන්තික ස්තරයන්ගෙන් එල්ල වූ විරෝධයේ මට්ටම හා තරම ද එයින් උද්ගත කල දුෂ්කරතාවන් ද හෙලිදරව් කරයි. අද, රාජ්‍යය හෝ විශාල සමාගම් විසින් සේවයේ යොදවන ලද ඊනියා සුදුකරපටි කම්කරුවන් තවදුරටත් වරප්‍රසාදිත සමාජ තත්වයක් භුක්ති නොවිඳිති. ඔවුන් ද කම්කරු පන්තියේ වෙනත් ඕනෑ ම කොටසක් මෙන් ම කප්පාදුවට හෝ වටුප් හා සේවා තත්වයන් කපාහැරීමට මුහුන දෙති.

ආත්මීය සාධකයන්ගේ හා නිතරම වැදගත්වන නායකත්වයේ තත්වය කෙසේද? විසිවෙනි සියවසේ ඉතිහාසය පිලිබඳ අධ්‍යයනයකින් පෙන්වා දෙන්නේ කම්කරු පන්තිය විප්ලවවාදී නායකත්වයකින් සන්නද්ධවූ කල්හි 1917 ඔක්තෝබරයේ අත්දැකීම පුනර්කරනය වීමේ ඉඩ ප්‍රස්ථාවන්ගේ අඩුවක් නොමැති බවයි. ධනේශ්වරයට සැදැලය අරා සිටීමට ඉඩ සැලසී ඇත්තේ, සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ හා ස්ටැලින්වාදයේ ප්‍රතිවිප්ලවවාදී ක්‍රියාකලාපය හා හරියට ම එවන් නායකත්වයක් නොමැති වීමේ හේතුව ද නිසාය.

එහෙත් මෙම කාරනයේදී පවා ඉතිහාසය එහි කාර්යය ඉටුකර තිබේ. එක් අවධියකදී ලෝකය පුරාම කම්කරු පන්තිය තුල විශාල අනුගාමිකත්වයක් දිනා ගත් ස්ටැලින්වාදී හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ අද හිස් කෝම්බවලට වැඩි දෙයක් නො වේ. දෙවන ලෝක යුද්ධය ආසන්නයේ ට්‍රොට්ස්කි මෙසේ ලියා තිබුනි. මෙම යල් පිනූ සංවිධාන, එලඹෙන සිදුවීම් තුලදී එක් ගඩොලක් මත තවෙකක් ඉතිරි නොවන පරිදි බිඳ වැටෙනු ඇතැයි ඔහු අනාවැකි පලකලේය. එය සිදුවීමට ඔහු බලාපොරොත්තු වූවාට වැඩි කලක් ගත වුවත් එය සිදුව තිබේ.

මෙම මැතිවරන ව්‍යාපාරය තුල සක්සුදක් සේ පැහැදිලි වන පරිදි ලේබර් පක්ෂය කෙරෙහි දක්වන පිලිකුල හා විරුද්ධත්වය, සියලු ම පැරනි පක්ෂ හා නායකත්වයන්ට විරුද්ධවීමේ ගෝලීයව දැකිය හැකි වෙනසක කොටසකි. තවද මේවාට ජීවන හුස්ම පිඹීම සඳහා විවධ මධ්‍යම පන්තික සංවිධාන ගන්නා ඊනියා නව කාන්ඩ ගැසීමේ උත්සාහයන් විස්මයජනක ලෙස අසාර්ථක වී තිබේ.

ඇඟවුම් කවරේද? අප ප්‍රශ්නය මේ ආකාරයට ඉදිරිපත් කලහොත් වඩා පැහැදිලි වනු ඇත. බොල්ෂෙවිකයන් බලය ගත් තැන් පටන් වසර අනූවක් ඉක්මගිය තැන ද සමාජවාදී විප්ලව හිඟව ඇත්තේ මන්ද? ප්‍රධාන සාධක දෙකක් ක්‍රියාත්මකව තිබේ. කම්කරු පන්ති නායකත්වයේ ද්‍රෝහී ක්‍රියා කලාපය හා ගෝලීය ධනේශ්වර පර්යායට එක්තරා ස්ථාවරත්වයක් සැපයීමට එක්සත් ජනපද ධනවාදයට තිබූ හැකියාවයි. අද පැරනි පක්ෂ හා සංවිධාන කලකදී තමන්ට සිටි අනුගාමිකත්වයෙන් තොර ය. එක්සත් ජනපදය ලෝක ආර්ථිකයේ හා දේශපාලනයේ වඩාත් ම අස්ථාවරකාරී සාධකය යි.

මෙම ප්‍රගාඪ වෙනස්කම් දුර දිග යන දේශපාලන ඇඟවුම් ගැබ්කර ගනියි. ලෝකය පුරාම වෙනසක් සඳහා වැඩෙන අභිලාෂයක් ද අතෘප්තිමත් භාවයේ වැඩිවන හැඟීමක් ද සාමාන්‍ය වැඩ කරන ජනතාව අතර දක්නට ලැබේ. එහෙත් තවමත් සමාජයේ ගැටලු ජයගන්නේ කෙසේද යන්න පිලිබඳ අවබෝධයක් නැත. වෙනත් වචනවලින් කිවහොත් ඉදිරි දර්ශනය පිලිබඳව ගැඹුරු අර්බුදයක් පවතී.

මෙය කම්කරු පන්තියේ යම් ඓන්ද්‍රීය නොහැකියාවක ප්‍රතිඵලය නොව සංකීර්න ඓතිහාසික සිදුකිරීම්වල ප්‍රතිඵලයයි. ඉදිරි දර්ශනය පිලිබඳ මෙම අර්බුදය ජයගැනීමේ කෙන්ද්‍රේසි වේගයෙන් මෝරමින් එයි.

අප පක්ෂයේ තීරනාත්මක කාර්යභාරය රැඳී ඇත්තේ මෙහිය. රුසියානු විප්ලවයේ පටන් අනූවසරක් තුල බොල්ෂෙවික්වාදයේ සම්ප්‍රධායන් හා එය ප්‍රානවත් කල මූලධර්ම ආරක්ෂා කිරීම මත දැනුවත්ව පදනම් වන ලෝක ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය වන හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව එම පක්ෂයයි.

අප අතෙහි ඇති කර්තව්‍යය කම්කරු පන්තිය තුල සමාජවාදී විඥානය වර්ධනය කිරීමයි. මෙහි අර්ථය වන්නේ ධනවාදයට එරෙහිව සටන්වැදීමේ අවශ්‍යතාවය කම්කරුවන්ට ඒත්තු ගැන්වීම නො වේ. එවන් අරගල අනිවාර්ය ය. කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය මත පදනම් වූ ක්‍රියාමාර්ගය හා ඉදිරි දර්ශනය සෑම අදියරකදී ම ඉදිරියට ගෙනයෑම මගින් ධනවාදය පෙරලා දැමීමේ දැනුවත් දේශපාලන අරගලයක් බවට මෙම නොදැනුවත් ව්‍යාපරය පරිවර්තනය කිරීම මූලික ප්‍රශ්නයයි.

රුසියානු විප්ලවයේ නායකත්වය බවට බොල්ෂෙවිකයන් පත්කරනු ලැබුවේ ද, ගෝලීය ප්‍රාග්ධනයේ බල කඳවුරට ජාත්‍යාන්තර කම්කරු පන්තිය විසින් එල්ල කල ප්‍රථම ප්‍රහාරයට නායකත්වය සම්පාදනය කලේ ද මෙම විධික්‍රමය මගින්ය. ඔවුන් ආරම්භ කල එම කර්තව්‍ය නිමාවකට ගෙන ඒම ද දැන් අපගේ උර මතට වැටී තිබේ. අපගේ පක්ෂයට බැඳෙමින් ජාත්‍යන්තර කම්කරු පන්තියේ නව නායකත්වය ලෙස මෙම වගකීම අතට ගන්නා ලෙස අප ඔබගෙන් උදක්ම ඉල්ලා සිටිමු.

**සමාප්තයි**

© www.wsws.org